## සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය

# සබරගමුව පළාත් සභාව

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ

## උපදේශක (කර්මාන්ත) ජුකි මැහුම් III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන – බණ්ඩ 2 සේවා ගණය (MN 1-2016) උපදේශක (කර්මාන්ත) ජුකි මැහුම් III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පුරප්පාඩු සංඛ්‍යාව - 01**

**02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය - 2024.08.30**

**03. බඳවා ගැනීමේ සුදුසුකම් :**

**(අ) අධ්‍යාපන සුදුසුකම් :**

i. මව්බස (සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**(ආ) වෘත්තීය සුදුසුකම් :**

i. ජුකි මැහුම් ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ - 4) නිපුණතාවය ලබා තිබීම.

හෝ

ii. කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව / රජයේ පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන වෘත්තියට අදාළ දෑ අවුරුදු පාඨමාලා සහතිකයක් ලබා තිබීම. (පළමු කාර්යක්ෂමතා කඩඉමට පෙර NVQ - 4 නිපුණතාවය ලබා ගත යුතුය)

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

05. **තනතුරට හිමි වැටුප් පරිමාණය :**

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව උපදේශක (කර්මාන්ත) ජුකි මැහුම් III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN1-2016 වන අතර අදාළ මාසික වැටුප් පරිමාණය රු. 27,140-10x300-11x350-10x495-10x660 – රු. 45,540/– වේ.

06. ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූවන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයන් දෙකෙන්ම සමත් වූවන්ගෙන් ලබාගන්නා ලද මුළු ලකුණු එකතුවෙන් වැඩි ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙළට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුව බඳවා ගනු ලැබේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි සඳහන් විධිවිධාන වලට අනුකූලව කටයුතු කරනු ලැබේ.

07. මෙම බඳවා ගැනීමට අදාළ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය www.sg.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත.

**දිනිෂා එස්. රත්නායක**
**ලේකම්,**
**සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක,**
**ග්‍රාම සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය,**
**සබරගමුව පළාත් සභාව.**
**2024.07.11**